Useful Phrases for Translators

Department of Official Languages - Sri Lanka

English-Sinhala

This book contains a collection of useful phrases extracted from a variety of administrative documents including the Constitution of Sri Lanka, the Civil Procedure Code and the Criminal Code Procedure of Sri Lanka, the Establishment Code of Sri Lanka, Government Gazettes, Acts and Ordinances, for the benefit of the translators in government service as well as freelancers.

It also consists of a list of Latin and French terms frequently used in the legal documents.

Useful Phrases

	English Phrase	Sinhala Phrase
1.	This extension is **effective from** 01.01.2022.	මෙම දීර්ඝ කිරීම 2022.01.01 **දින සිට ක්‍රියාත්මක වේ.**
2.	determining the date of retirement for the purpose of **sending on retirement** on medical grounds	වෛද්‍ය හේතූන් මත **විශ්‍රාම ගන්වන** අවස්ථාවක විශ්‍රාම ගන්වන දිනය තීරණය කිරීම
3.	specifically **provided for** by any other law passed by Parliament	පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද වෙනත් යම් නීතියකින් නිශ්චිතව **විධිවිධාන සලසා ඇති**
4.	**promptly be informed** to the Director General of Pensions	විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා හට **අප්‍රමාදව දැනුම් දිය යුතු ය**
5.	the officers who **are entitled to** pension under Schedule “Q” of the Pension Minute	විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ “ට” උපලේඛනය යටතේ විශ්‍රාම වැටුප් **හිමිකම ලබන** නිලධරයන්
6.	This circular is issued **with the consent of** the Ministry of Finance.	මෙම චක්‍රලේඛය මුදල් අමාත්‍යාංශයේ **එකඟතාවය ඇතිව නිකුත් කෙරේ.**
7.	Only one opportunity will be given **in due course.**	**ඉදිරියේ දී** එක් අවස්ථාවක් පමණක් හිමිවනු ඇත.
8.	This Act **may be cited as** the Penal Code (Amendment) Act, No. 25 of 2021.	මෙම පනත 2021 අංක 25 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත **යනුවෙන් හඳුන්වනු ලැබේ.**
9.	to provide for **matters connected therewith or incidental thereto**	**ඊට සම්බන්ධ හෝ ආනුෂංගික සියලු කරුණු සඳහා** විධිවිධාන සැලැස්වීම පිණිස
10.	**hereinafter referred to as** the “Authority”	**මෙහි මින් මතු** ‘අධිකාරිය’ **යනුවෙන් හඳුන්වනු ලබන**
11.	the date of commencement of the **term of office** of the new President	නව ජනාධිපතිවරයාගේ **ධුර කාලය** ආරම්භ වන දිනය

12.	in the event of the **vacation of office** by death, resignation or removal of any appointed member	යම් පත්කළ සාමාජිකයකු මියයාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම නිසා **ධුරය හිස්වන** අවස්ථාවක දී
13.	**On the conclusion of such business,** the parliament shall stand adjourned to the date and time fixed by the parliament.	**එකී කාර්යය අවසානයේ දී,** පාර්ලිමේන්තුව විසින් නියම කරන ලද දිනය සහ වෙලාව වන තෙක් පාර්ලිමේන්තුව කල් තැබිය යුත්තේ ය.
14.	be appointed by the President **by warrant under his hand**	ජනාධිපතිවරයා විසින් **ස්වකීය අත්සන යටතේ වූ අධිකාර පත්‍රයක් මගින්** පත් කරනු ලබන්නේ ය
15.	**published by authority**	**රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදි**
16.	the formula for the payment of compensation to a workman, **set out in the schedule thereto**	**එහි උපලේඛනයේ දක්වා ඇති** කම්කරුවෙකුට වන්දි මුදල් ගෙවීම පිළිබඳ සූත්‍රය
17.	in terms of **applicable written laws**	**අදාළ ලිඛිත නීතීන්** ප්‍රකාරව
18.	printed **on the Order of Government**	**ආණ්ඩුවේ නියමය පරිදි** මුද්‍රණය කරන ලදි
19.	seeking the authority **to deviate from** the provisions	විධිවිධානවලින් **බැහැරව කටයුතු කිරීම** පිණිස බලය ඉල්ලා සිටීම
20.	The Supreme Court shall have **sole and exclusive jurisdiction.**	**තනි හා අනන්‍ය අධිකරණ බලය** ශ්‍රේෂ්ඨාධිකරණයට ඇත්තේ ය.
21.	The interest on the public debt, **sinking fund** payments, the costs, charges and expenses incidental to the collection, management and receipt of the Consolidated Fund and such other expenditure as Parliament may determine shall be charged on the Consolidated Fund.	රාජ්‍ය ණය අරමුදලේ පොලිය ද, **නිදන් අරමුදලට** ගෙවන මුදල් ද, ඒකාබද්ධ අරමුදල එකතු කිරීම, පාලනය කිරීම සහ භාර ගැනීම යනාදී කටයුතු හා සම්බන්ධ පිරිවැය, ගාස්තු සහ වියදම් ද, පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලබන්නා වූ වෙනත් වියදමක් වේ නම් ඒ වියදම් ද, ඒකාබද්ධ අරමුදලට වැය බරක් කළ යුත්තේ ය.
22.	The Board of Ministers shall be **collectively responsible and**	අමාත්‍ය මණ්ඩලය පළාත් සභාවට **සාමූහිකව වගකීමට සහ උත්තර දීමට** බැඳී සිටින්නේ ය.

	answerable to the Provincial Council.	
23.	The Governor **has intentionally violated** the provisions of the Constitution.	ආණ්ඩුකාරවරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන **චේතාන්විතව උල්ලංඝනය කර ඇත.**
24.	**during the pleasure of** the President	ජනාධිපතිවරයාගේ **ප්‍රසාදය ඇති තාක් කල්**
25.	A state land which has not been surveyed by the Surveyor-General shall not be **alienated by a grant**.	මැනුම්පති විසින් මනිනු නොලැබූ රජයේ ඉඩමක් **ප්‍රදාන පත්‍රයක් මගින් අන්සතු කරනු** නොලැබිය යුතු ය.
26.	The Parliamentary Commissioner for Administration shall, subject to the provisions of Article 41A, be appointed by the President and shall hold office **during good behavior**.	පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා, 41අ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු අතර එම කොමසාරිස්වරයා **යථා පැවැත්මෙන් සිටින තාක්** ස්වකීය ධුරය දැරිය යුත්තේ ය.
27.	No executive or administrative action shall be taken, **in contravention of the provisions** of such treaty or agreement.	ඒ ගිවිසුමේ හෝ සම්මුතියේ **විධිවිධාන කඩ කෙරෙන** කිසිම විධායක හෝ පරිපාලන ක්‍රියාවක් කිරීම ද නොකළ යුත්තේ ය.
28.	within one month of the date on which this Article **comes into force**	මේ ව්‍යවස්ථාව **බලාත්මක** වූ දින සිට මාසයක් ඇතුළත දී
29.	The Supreme Court established by the Administration of Justice Law, No. 44 of 1973, shall, **on the commencement of the Constitution**, cease to exist.	ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතින් පිහිටුවන ලද ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවැත්ම **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වූ විට** නතර වන්නේ ය.
30.	The Court of Appeal shall have jurisdiction **to take cognizance of** and to hear and determine the proceeding.	නඩු කටයුතු **සංජානනය කිරීමට** සහ විභාග කොට තීරණය කිරීමට අධිකරණ බලය අභියාචනාධිකරණයට ඇත්තේ ය.
31.	done by **accident or misfortune**	**අහම්බෙන් හෝ අවාසනාවෙන්** සිදු කළ
32.	No act of such person or proceeding held before such person, prior to such determination, **shall be, deemed to be invalid** by reason of such determination.	ඒ තීරණයට පෙර එවැනි තැනැත්තකු විසින් කරන ලද කිසියම් ක්‍රියාවක් හෝ එවැනි තැනැත්තකු ඉදිරියේ පවත්වනු ලැබූ නඩු කටයුත්තක් ඒ තීරණය හේතු කොට ගෙන **නිර්බල වන්නේ යැයි** නොසැලකිය යුත්තේ

		ය.
33.	any authority created and established **by or under any law**	**යම් කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ** ඇති කොට පිහිටුවන ලද කවර හෝ අධිකාරියක්
34.	**without prejudice to the powers** of the President under Article 34 and subject to his directions	34 වන ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාගේ **බලතලවලට හානියක් නොමැතිව,** සහ ඔහුගේ විධානවලට යටත්ව
35.	applications prepared **in conformity with the format given**	**දී ඇති ආකෘතිය අනුව** සැකසූ අයදුම්පත්
36.	The Inspector General of Police shall appoint a Deputy Inspector General of Police for each Province **with the concurrence of** the Chief Minister of the Province.	එක් එක් පළාත සඳහා ඒ ඒ පළාතේ ප්‍රධාන අමාත්‍යවරයාගේ **එකඟතාවය ඇතිව** පොලිස්පතිවරයා විසින් නියෝජ්‍ය පොලිස්පතිවරයකු පත් කළ යුතු ය.
37.	No person shall be punished with death or imprisonment except **by order of a competent court**, made in accordance with procedure established by law.	නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව **නිසි අධිකරණයක් විසින් කරනු ලැබූ ආඥාවක් අනුව** මිස කිසිම තැනැත්තකු මරණීය දණ්ඩනයට යටත් කිරීම හෝ කිසිම තැනැත්තකු බන්ධනාගාරගත කිරීම හෝ නොකළ යුත්තේ ය.
38.	the jurisdiction conferred on the court of Appeal by the **preceding provisions** of this Article	මේ ව්‍යවස්ථාවේ **ඉහතින් ම වූ විධිවිධානවලින්** අභියාචනාධිකරණය වෙත පැවරී ඇති අධිකරණ බලය
39.	Any person charged with an offence shall be entitled to be heard, in person or by an attorney-at-law, at **a fair trial** by a competent court.	වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව චෝදනා නගනු ලැබ ඇත්තේද, ඒ තැනැත්තාට, නිසි අධිකරණයක් විසින් පවත්වනු ලබන **සාධාරණ නඩු විභාගයක දී** පෞද්ගලිකව ම හෝ නීතිඥවරයකු මගින් හෝ කරුණු කියා සිටීමට හිමිකම් ඇත්තේ ය.
40.	It shall not be contravention of this Article to require the **imposition of a minimum penalty** for an offence provided that such penalty does not exceed the maximum penalty prescribed for such offence at the time such offence was committed.	යම් වරදක් සඳහා **නියම කරනු ලබන අවම දණ්ඩනය** ඒ වරද සිදු කළ අවස්ථාවේ දී ඒ වරද සඳහා නියමිතව තිබුණු උපරිම දණ්ඩනය නොඉක්මවන්නේ නම්, ඒ වරද සඳහා එකී අවම දණ්ඩනය පනවන ලෙස නියම කිරීම මේ ව්‍යවස්ථාවේ විධිවිධාන කඩකිරීමක් නොවන්නේ ය.

41.	**punishment of detention** in lieu of death	මරණීය දණ්ඩනය වෙනුවට **රඳවා තැබීමේ දණ්ඩනය** නියම කිරීම
42.	**Be it enacted by** the Parliament of the Democratic Socialist Republic of Sri Lanka **as follows**.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් **මෙසේ පනවනු ලැබේ.**
43.	**In the event of any inconsistency** between the Sinhala and Tamil texts of this Act, the Sinhala text shall prevail.	මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර **යම් අනනුකූලතාවක් ඇති වුවහොත්** එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.
44.	without any **criminal intention or knowledge**	**සාපරාධී අදහසක් හෝ දැනුමක්** නොමැතිව
45.	The complainant should prove the aforesaid burden of proof **beyond a reasonable doubt**	පැමිණිල්ල විසින් ඉහත කී ඔප්පු කිරීමේ භාරය **සාධාරණ සැකයෙන් ඔබ්බට** ඔප්පු කළ යුත්තේ ය.
46.	The **burden of proof** of this charge against her is entirely dependent on the complainant.	ඇයට විරුද්ධව එල්ල වී ඇති මෙම චෝදනාවේ **ඔප්පු කිරීමේ භාරය** සම්පූර්ණයෙන්ම රඳා පවතින්නේ පැමිණිල්ල මත ය.
47.	Upon delegation of any of its powers to a Committee or a public officer appointed under Article 56 or Article 57 **as the case may be**	**අවස්ථාවෝචිත පරිදි** 56 වන ව්‍යවස්ථාව හෝ 57 වන ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද කමිටුවකට හෝ රජයේ නිලධරයකුට කොමිෂන් සභාවේ යම් බලතල පවරා දෙනු ලැබූ විට,
48.	as there are no **disputed questions of fact**	**මතභේදාත්මක පරිසිද්ධි ප්‍රශ්න** නොමැති බැවින්
49.	The Court granted **leave to proceed.**	අධිකරණය විසින් **නඩු කටයුතු පවත්වාගෙන යාමට අවසරය** ලබා දෙන ලදි.
50.	**argued on**: 01.01.2022	**විභාගයට ගැණුනු දිනය** 2022.01.01
51.	The accused has **sufficiently established his innocence.**	චූදිත නිලධරයා විසින් **ස්වකීය නිර්දෝෂීභාවය ප්‍රමාණවත් ලෙස සනාථ කර ඇත.**
52.	An act done is not an offence unless done with a **particular knowledge or**	**විශේෂ දැනුමක් හෝ අදහසක්** නොමැතිව කරනු ලැබූ ක්‍රියාවක් වරදක් නොවේ.

	intent.	
53.	**an ordinance to incorporate** the committee of the institution	ආයතනයේ කමිටුව **සංස්ථාගත කිරීම සඳහා වූ ආඥා පනතකි.**
54.	**with the advise and consent** of the Legislative Council	ව්‍යවස්ථාදායක මණ්ඩලයේ **උපදේශය සහ අනුමතිය පරිදි**
55.	**in the matter of an application for** mandates in the nature of a Writs of Certiorari and Mandamus under and in terms of Article 140 of the Constitution	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 140 වන ව්‍යවස්ථාව යටතේ සහ එම ව්‍යවස්ථාව ප්‍රකාරව සර්ටියොරාරි සහ මැන්ඩාමුස් රිට් ආඥා ස්වභාවයේ වූ අධිකරණ විධාන සඳහා **කරන ලද ඉල්ලීමක් පිළිබඳ කාරණයේ දී** ය
56.	A true copy of the National Identity card of the petitioner is attached herewith, marked as X1 and **pleaded part and parcel hereof**.	පෙත්සම්කරුගේ ජාතික හැඳුනුම්පතෙහි සත්‍ය බවට සහතික කළ පිටපතක් මේ සමග අමුණා, X1 ලෙස සලකුණු කොට ඇති අතර **මෙහිම කොටසක් ලෙස සලකන මෙන් අයැද සිටිමි.**
57.	any person who is **justified by the law**	**නීතියෙන් හේතු යුක්තියක්** ඇත්තකු විසින්
58.	after **perusal of explanations** submitted by the officer	නිලධරයා විසින් ඉදිරිපත් කර ඇති **නිදහසට කරුණු සලකා බැලීමෙන්** පසු
59.	in such a manner as to impede the **due progress of the disciplinary inquiry**	**විනය පරීක්ෂණය යථාපරිදි පවත්වාගෙන** යාමට බාධා වන ආකාරයෙන්
60.	**subject to the restrictions** contained in Section 92	92 වන වගන්තියේ ඇතුළත් **සීමා කිරීම්වලට යටත්ව**
61.	to grant **such other and further** reliefs as Your Lordship Court shall seem fit	ගරු අධිකරණයට සුදුසු යැයි පෙනෙන **එවැනි වෙනත් සහ වැඩිදුර** සහන ප්‍රදානය කිරීම
62.	The **financial year** of the body corporate shall be the calendar year.	සංස්ථාපිත මණ්ඩලයේ **මුදල් වර්ෂය** ලිත් වර්ෂය විය යුතු ය.
63.	in the exercise, performance and discharge of its powers, **duties and functions** under the Act	මෙම පනත යටතේ ස්වකීය බලතල, **කාර්යය සහ කර්තව්‍ය** ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී
64.	**deferment of Salary Increment** on	කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ නොකිරීම මත **වැටුප් වර්ධක විලම්බනය**

	non-completion of Efficiency Bar Examination	**කිරීම**
65.	An officer is required to discharge **with diligence and efficiency** any duties in which the State may think it desirable to employ him.	නිලධරයකු ලවා ඉටු කරවා ගැනීම මැනවැයි රජයට හැඟී යන ඕනෑම රාජකාරියක් ඉටු කරන ලෙස නියම කරනු ලැබූ විට නිලධරයා විසින් ඒ රාජකාරිය **කාර්යක්ෂමව ද අනලස්ව ද** ඉටු කළ යුතු ය.
66.	The Appointing Authority will take action to fill vacancies, as provided for in the **approved Scheme of Recruitment**.	**අනුමත බඳවා ගැනීමේ පටිපාටියෙහි** විධිවිධාන සලසා ඇති පරිදි පුරප්පාඩු පිරවීමට පත්කිරීමේ බලධාරියා ක්‍රියා කරනු ඇත.
67.	**An appointment on casual basis** shall be made only if allocations are made in the annual estimate or in the approved estimate for the relevant task.	**අනියම් පදනම මත පත් කිරීමක්** කළ යුතු වන්නේ හුදෙක්ම අදාළ කාර්යය සඳහා ප්‍රමාණවත් මූල්‍යමය ප්‍රතිපාදන, වාර්ෂික ඇස්තමේන්තු තුළ වෙන් කර ඇත්නම් හෝ අදාළ කාර්යය සඳහා වන අනුමත ඇස්තමේන්තුව තුළ වෙන් කර ඇත්නම් හෝ පමණක් වන්නේ ය.
68.	**Appointment on substitute basis** shall be made solely on the basis of paying daily wages.	**ආදේශක පදනම මත පත් කිරීමක්** කළ යුත්තේ හුදෙක්ම දෛනික වැටුප් ගෙවීමේ පදනමින් පමණක් වන්නේ ය.
69.	The date of the letter of appointment or the date on which the officer assumes duties, whichever comes later, shall be **the effective date of the appointment**.	පත්වීම් ලිපියේ සඳහන් වන දිනය හෝ නිලධරයා තනතුරෙහි වැඩ භාර ගන්නා දිනය හෝ යන දින දෙකෙන් පසුව එළඹෙන දිනය **පත්වීම ක්‍රියාත්මක වන දිනය** වන්නේ ය.
70.	When a person is produced before any Magistrate, the magistrate shall remand such person **until the conclusion of the trial**.	යම් තැනැත්තකු යම් මහේස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, මහේස්ත්‍රාත්වරයා විසින් ඒ තැනැත්තා **නඩු විභාගය අවසන් වන තෙක්** රිමාන්ඩ් භාරයේ තැබිය යුතු ය.
71.	The **legal and physical custody** of the children is granted to the plaintiff.	දරුවන්ගේ **නෛතික හා ශාරීරික භාරකාරත්වය** පැමිණිලිකරුට ලබා දේ.
72.	The dependent **did not appear in person**.	විත්තිකරු **පුද්ගලිකව පෙනී නොසිටියේ ය.**
73.	on the ground of **matrimonial offence of malicious deserion** on the part of	විත්තිකරුගේ **ද්වේශසහගත අතහැරයාමේ වෛවාහක වරද** මත

	the dependent	
74.	The judgment for divorce is granted **in favour of** the plaintiff.	පැමිණිලිකරුගේ **වාසියට** දික්කසාද තීන්දුව ලබා දෙන ලදි.
75.	**by virtue of his office** as a public servant	රජයේ සේවකයකු වශයෙන් වූ **ස්වකීය ධුරය ප්‍රකාර**
76.	to cause **wrongful or unlawful loss** to the Government	ආණ්ඩුවට **අයුතු සහගත ලෙස හෝ නීතිවිරෝධී ලෙස පාඩු** සිදු කිරීම
77.	any public servant who induces any other person, by the use, **whether directly or indirectly**, of his office as such public servant to perform, or refrain from performing any act	රජයේ සේවකයකු වශයෙන් වූ ස්වකීය ධුරය **කෙළින් ම හෝ අන්‍යාකාරයකින් හෝ** පාවිච්චි කිරීමෙන් යම් ක්‍රියාවක් ඉටු කිරීමට හෝ ඉටු කිරීමෙන් වැළකී සිටීමට වෙනත් යම් තැනැත්තකු පොළඹවන යම් රජයේ සේවකයකු
78.	shall be **guilty of the offence of corruption**	**දූෂණය පිළිබඳ වරද සම්බන්ධයෙන් වරදකරු** විය යුතු අතර
79.	**matter in dispute**	**විවාදාපන්න කාරණය**
80.	within **the period of absorption**	**අන්තර්ග්‍රහණය කෙරෙන කාල සීමාව** තුළ
81.	**decided on** : 26.02.2009	**තීන්දුව ප්‍රකාශයට පත් කළ දිනය**: 2009.02.26
82.	**upon a summary trail** by a Magistrate	මහේස්ත්‍රාත්වරයකු විසින් **පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු**
83.	**be liable to** imprisonment for a term not exceeding ten years	අවුරුදු දහයක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත **කිරීමකට යටත් විය යුතු ය.**
84.	**by or with the written sanction of the** commission	කොමිසමේ **ලිඛිත අනුමතිය මගින් හෝ සහිතව**
85.	**to be read with** Section 467 of the Penal Code	දණ්ඩ නීති සංග්‍රහයේ 467 වෙනි වගන්තිය **සමග කියවිය යුතු**
86.	prevention of **contempt of court**	**අධිකරණයට අපහාස කිරීම** වැළැක්වීම
87.	in respect of infringement or **imminent**	යම් මූලික අයිතිවාසිකමක් යම් විධායක හෝ පරිපාලනමය ක්‍රියාවක් මගින් උල්ලංඝනය

	infringement, by executive or administrative action, of a fundamental right	කර තිබීම හෝ උල්ලංඝනය **කිරීමට අත්‍යාසන්නව තිබීම**
88.	**Notwithstanding anything contained in** paragraph (1)	(1) වන අනුව්‍යවස්ථාවේ **කුමක් සඳහන් වුව ද**
89.	**sitting of** the Court of Appeal	අභියාචනාධිකරණය **පැවැත්වීම**
90.	The accused has committed the offences in **the counts of indictment**.	චූදිතයා **අධිචෝදනා පත්‍රයේ සඳහන් චෝදනාවල** අඩංගු වරදවල් සිදු කර ඇත.
91.	**by implication of law**	**නීතියේ අනුමිතියෙන්**
92.	**deed under seal**	**මුද්‍රා තැබූ ඔප්පුව**
93.	**plead to the indictment**	**අධිචෝදනා පත්‍රයට උත්තරවාද ඉදිරිපත් කිරීම**
94.	any transaction so effected will be **null and void**	එසේ සිදු කරන යම් ගනුදෙනුවක් **ශූන්‍ය හා බලරහිත** වන්නේ ය
95.	any proceedings in relation to any alleged **breach of privileges of Parliament** pending in the Supreme Court	**පාර්ලිමේන්තු වරප්‍රසාද කඩකිරීමට** අදාළව ශ්‍රේෂ්ඨාධිකරණයෙහි විභාගයට භාජනව පවතින යම් නඩු කටයුත්තක්
96.	Every provision of this Act shall for all purposes and in all respects be **as valid and effectual**.	මේ පනතේ සෑම විධානයක්ම සියලුම කාර්යයන් සඳහා සෑම අතින්ම **වලංගු හා බල සහිත විය යුතු ය.**
97.	**for prescribing the manner** in which the election of elected members of the Victoria Home shall be conducted	වික්ටෝරියා නිවාසයේ තෝරා පත්කර ගත යුතු සාමාජිකයන් තෝරා පත්කර ගැනීම සිදු කළ යුතු **ආකාරය නියම කිරීම**
98.	Cabinet approval signified	අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ
99.	setting out her **objections to the proposed acquisition**	**යෝජිත අත්කර ගැනීම සම්බන්ධයෙන්** ඇගේ **විරෝධතා** දක්වමින්
100.	**An Authority with Delegated Power** shall act promptly on matters entrusted to him.	**බලය අභිනියෝජිත බලධරයෙකු** වෙත පැවරී ඇති කාර්යයන් අනලස්ව ඉටු කිරීමට එම බලධරයා ක්‍රියා කළ යුතු වන්නේ ය.

A List of Latin Terms

No.	Latin Term	Sinhala Meaning
1	*ab initio*	මුල පටන්
2	*ab intestato*	අන්තිම කැමති පත්‍රයක් නොමැතිව /තෙස්තමේන්තු රහිතව
3	*actus reus*	අන්‍යායී / සාවද්‍ය ක්‍රියාව
4	*ad hoc*	තත්කාර්ය/තත්කාර්යගත
5	*alimony pendent lite*	නඩු තීන්දුව තෙක් ගෙවන දික්කසාද දීමනාව
6	*animus contrahendi*	ගිවිසුමේ පාර්ශ්වකරුවන්ගේ චේතනාව
7	*animus furandi*	සොරා ගැනීමේ චේතනාව
8	*animus injuriandi*	හිංසන චේතනාව
9	*animus manendi*	පදිංචිව සිටීමේ චේතනාව
10	*animus nocendi vicino*	අසල්වැසි පීඩන චේතනාව
11	*animus novandi*	අලුත් කිරීමේ චේතනාව
12	*ante litem motan*	නඩුව ආරම්භ වීමට පෙර
13	*beneficium abstinendi*	උරුමය අත් හැරීමේ වාසිය
14	*bona fide*	සද්භාවයෙන්
15	*bona adventicia*	ආගන්තුක උරුම දේපළ
16	*bonorum possessio*	දේපළ බුක්තිය
17	*bonorum vendetio*	දේපළ විකිණීම
18	*cadit quaestio*	වෙනත් තර්කවලට ඉඩ නොමැති / ආරවුල අවසන්
19	*damnum*	අලාභය
20	*de facto*	තත්ත්වාකාරයෙන්
21	*de jure*	නීති ප්‍රකාර
22	*del credere*	කැපකරු
23	*donatio mortis causa*	ප්‍රදානය කරන්නා මරණය අපේක්ෂාවෙන් මරණාසන්නයේ දී කරන ප්‍රදානය
24	*doli capax*	වංචාවක් කළ හැකි
25	*emphyteusis*	සදාකාලික බද්ද
26	*ex aequo et bono*	සාධාරණතාව හා සද්භාවය අනුව
27	*ex contractu*	ගිවිසුමකින්
28	*ex debito justitiae*	යුක්ති ධර්මයෙන් හිමි
29	*ex delicto*	සිවිල් වරදකින් උද්ගත වන
30	*ex justa causa*	සාධාරණ හේතුවකින්
31	*ex lege*	නීතිය අනුව
32	*ex officio*	නිල බලයෙන්
33	*ex parte*	ඒක පාර්ශ්වික
34	*ex parte materna*	මව් පාර්ශ්වයෙන්
35	*ex post facto*	සිද්ධියෙන් පසු
36	*ex turpi causa*	සාවද්‍ය ගිවිසුමකින්

37	*expressio verbis*	ප්‍රකාශිත වචනයෙන්
38	*expressum facit cessare tactitum*	ප්‍රකාශිතව සඳහන් කළ දෙයින් අප්‍රකාශිත දෙය බැහැර කෙරේ
39	*factum probandum*	ඔප්පු කළ යුතු කාරණය
40	*felonia de se*	සිය පණ හානි කරගැනීමේ අපරාධය /ආත්මඝාත අපරාධය
41	*feme sole*	අවිවාහිකාව
42	*furtum*	සොරකම
43	*furtum manifestum*	ප්‍රත්‍යක්ෂ සොරකම
44	*habeas corpus*	හේබියස් කෝපුස් ආඥාව
45	*hereditas jacens*	නොපිළිගත් බූදලය
46	*heres*	උරුමක්කාරයා
47	*in alieno solo*	අන් අයෙකුගේ ඉඩමේ
48	*in esse*	පවත්නා
49	*in extenso*	දිගටම
50	*in lieu of*	වෙනුවට
51	*in limine*	ආරම්භයේ දී
52	*in loco*	ස්ථානයේදී ම
53	*in loco parentis*	දෙමව්පියන් වෙනුවට
54	*in longum tempus*	දීර්ඝ කාලයකට
55	*in pari causa possessor potior haberi debet*	යම් දේපළක් කෙරෙහි දෙදෙනෙකුගේ සම හිමිකම්පෑම ඇතිවිට බුක්තිය සතුව ඇති පුද්ගලයාගේ හිමිකම වඩා ශක්තිමත්
56	*in pari delicito*	දෙපාර්ශ්වයම සමාන ලෙස වරදකරුවන් වන විට
57	*in personam*	පුද්ගල බන්ධක
58	*in praesenti*	වහාම
59	*in propria persona*	තමන්ගේම නමින් (නීතිඥ සහායක් නොමැතිව)
60	*in re*	සම්බන්ධ /පිළිබඳව
61	*in tail male*	පිරිමි උරුමකරුවන්ට සීමා වූ
62	*in toto*	මුළුමනින්ම
63	*inter absentes*	නොපැමිණියන් අතර
64	*inter alia*	වෙනත් දේ අතර / වෙනත් කරුණු අතර
65	*inter alios*	වෙනත් අය අතර
66	*inter partes*	පාර්ශ්වකරුවන් අතර
67	*inter praesentes*	පැමිණ සිටියවුන් අතර
68	*inter se*	තමන් අතර
69	*inter vivos*	ජීවත්ව සිටිය දී
70	*ipso jure*	නීතියෙන්ම
71	*judicatum solvi*	නඩු තීන්දුව ඉටු කිරීම
72	*judicium finium regendorum*	මායිම් තීරණය කිරීම සඳහා විනිශ්වයක්
73	*jura ad rem vel in personam*	දේපළ හෝ පුද්ගල අයිතිවාසිකම්

74	*jura in re*	දෙයකට ඇති අයිතිය
75	*jura naturalia*	ස්වාභාවික නීති
76	*jura regalia*	රාජකීය අයිතිවාසිකම්
77	*jure naturae*	ස්වාභාවිකව නීතියෙන් හිමි
78	*jure uxoris*	භාර්යාවගේ අයිතිය
79	*jus civile*	සිවිල් නීතිය
80	*jus cloacae*	දිය බැස්සීමේ අයිතිය
81	*jus commune*	ව්‍යවහාර නීතිය
82	*jus disponendi*	අන්සතු කිරීමේ අයිතිය
83	*jus dividendi*	අන්තිම කැමැත්තෙන් දේපළ දීමේ අයිතිය
84	*jus gentium*	ජාත්‍යන්තර නීතිය
85	*jus habendi*	තබා ගැනීමේ අයිතිය
86	*jus hodiernum*	වලංගුව පවත්නා නීතිය
87	*jus in personam*	පුද්ගලයකුට විරුද්ධ අයිතිවාසිකම්
88	*jus in re*	දේපළ සම්බන්ධ පූර්ණ අයිතිය
89	*jus mariti*	ස්වාමි පුරුෂ අයිතිය
90	*jus naturale*	සියල්ලන්ට පොදු ස්වාභාවික අයිතිය
91	*jus possessionis*	බුක්ති අයිතිය
92	*jus publicum*	ජන නීතිය
93	*jus respondendi*	නීති මත ප්‍රකාශ කිරීමේ අයිතිය
94	*jus retentionis*	රඳවා තබා ගැනීමේ අයිතිය
95	*jus retractus*	ආපසු ගැනීමේ අයිතිය
96	*jus superficiarum*	ගොඩනැගිල්ලේ අයිතිය
97	*jus tertii*	තෘතීය පාර්ශ්වයේ අයිතිය
98	*jus utendi et jus fruendi*	බුක්ති විඳීමේ අයිතිය
99	*jus vindicandi*	හිමිකම් තහවුරු කිරීමේ අයිතිය
100	*justa causa*	යුක්තිසහගත හේතුව
101	*laesio fidei*	විශ්වාසය බිඳීම
102	*mala fide*	අසද්භාවයෙන්
103	*mala in se*	ස්වාභාවයෙන්ම වැරදි
104	*mala prohibita*	නීතියෙන් තහනම් කළ ක්‍රියා
105	*mutatis mutandis*	අවශ්‍ය වෙනස් කිරීම් සහිතව
106	*nisi*	නයිසයි
107	*nisi prius*	ජූරිය ඉදිරියේ
108	*nolle prosequi, nol. pros.*	අධිචෝදනා නිවර්තනය/නිවර්තන නියෝගය
109	*non obstante veredicto, n.o.v.*	නඩු තීන්දුව කෙසේ වුව ද
110	*nota bene, N.B.*	සැලකිය යුතුයි, සැ. යු.

111	*nuda proprietas*	හුදු අයිතිය / නග්න හිමිකම
112	*nullius in bonis*	කිසිවෙකුට අයිති නැති දේවල්
113	*obiter dictum*	ආගන්තුක ප්‍රකාශය
114	*obligatio praetoria*	නඩුකර බන්ධනය
115	*pactum legitimum*	නීත්‍යානුකූල ගිවිසුම
116	*paterna paternis*	පිය උරුමය පිය පක්ෂයටය
117	*prima facie*	බැලූ බැල්මට පෙනෙන
118	*res nullius*	අයිතිකරුවෙකු නැති දේ
119	*restitutio in integrum*	යථා තත්ත්වයට පැමිණවීම
120	*sui juris*	ස්වාධිකාරී
121	*quasi*	සදිසි
122	*testamentum*	අන්තිම කැමති පත්‍රය
123	*utilis actio*	දීර්ඝ කිරීමේ නඩුකරය
124	*vide*	බලන්න
125	*vinculum juris*	නීති බැඳීම